


# නුවණැති මුවා

ජනුලි දනෝද්‍යා පුංචිහේවා

# නුවණැති

# මුවා

2025

කතෘ ප්‍රකාශනයකි

කතාව සහ චිත්‍ර - ජනුලි දනෝද්‍යා පුංචිහේවා

පාසල - මහාමායා බාලිකා විද්‍යාලය,මහනුවර

ශ්‍රේණිය - 4 B

කතෘගේ වෙනත් කෘති - සිඟිති ළමා පොත

2025/02/08

පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්වදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතිත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය හික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පිදුම

මට මේ කතන්දර පොත ලියන්නට අවස්ථාව ලබා දී මාව
ගත්කතුවරියක් බවට පත් කරන්නට
මා උනන්දු කරවූ ගුරුමෑණිවරුන්ට, පියවරුන්ට,
මාගේ දෙමව්පියන්ට සහ පවුලේ සැමට මගේ
පොත ආදරයෙන් පිළිගන්වමි

ලස්සන වනාන්තරයක හිටියා මුව රංචුවක්. එතනින් නුවණැත්තෙක් හිටියා. එයා තමයි මුව රංචුවේ කවුරුත් බේරා ගන්නා නුවණැති නායක මුවා.



මේ කැලයට එහා පැත්තේ තව කැලයක් තිබුණා. ඒ කැලයේ හිටියේ කොටි රැලක්.


මේ කොටි රැල හරිම නපුරුයි. කැලයේ සිටින අනෙක් සතුන් කොටි රැල සිටින කැලයට ගියේ නැහැ. මේ කොටි රැලේ නායකයා හරිම නපුරුයි වගේම හරිම දරුණුයි.




ටික කාලයක් ගත වුණා. මුව රංචුව සිටින කැලයේ වතුර නැති වුණා. මේ මුව රංචුවට ගොඩාක් දුක හිතුණා. නුවණැති මුව නායකයා කිව්වා "අපි එහා පැත්තේ තියෙන කැලයට ගිහින් වතුර බොමු " කියලා'



ඉතින් මේ මුව රංචුව එහා පැත්තේ තියෙන කැලයට ගියා. මේ මුව රංචුව වතුර බීලා එනකොට, කොටි රැළ පඳුරුවල හා ගස් උඩ හැංගිලා හිටියේ මුව රංචුව මරාගෙන කන්නයි.




මේ කොටි රැලේ එක කොටියෙක් මුව රංචුවේ සිටි මුවෙකුගේ ඇඟට පැන්නා. ඒක දැකපු මුව රංචුවේ නායකයා උගේ අං තට්ටුවෙන් කොටියාගේ බඩට ඇන්නා. ඒක නිසා මුවා බේරුණා.




මුව රංචුව කොටියන් සිටින කැලයෙන් ඉවතට වේගයෙන් දිව ගියා. මුව රංචුව කොටියන්ගෙන් බේරුණා.

මේ මුව රංචුවට ඔවුන්ගේ කැලයට යන්න පාර සොයා ගන්න බැරි වුණා. මුව රංචුව ගොඩාක් බය වුණා.



මුව නායකයා පොළවට ඉව අල්ලා ඔවුන්ගේ කැලය තිබෙන පාර සොයා ගත්තා. මුව රංචුවට ගොඩාක් සතුටුයි. මුව රංචුව මුව නායකයාට ස්තූති කළා. මුව රංචුව සැම කෙනෙකුටම උදව් කරමින් සතුටින් ජීවත් වුණා.



නුවණැති මුවා නිසා කැලයේ සිටින අනෙක් සතුන් හා මුව රංචුව බේරුණා.



මේ නුවණැති මුවා වගේ රටේ ලෝකයේ ජීවත් වෙන සැම කෙනෙකුටම උදව් උපකාර කරලා සතුටින් ජීවත් වෙන්න පුංචි අපටත් පුළුවන්.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවෙන් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැන්වීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මූලවීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහි මහාමයා බාලිකා විද්‍යාලයේ විදුහල්පත් තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාමි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියයෙන් වසර දෙකක සිට රටේම පාසල් ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN - 978-624-208-341-4